

## පමා නොවී එමි අකුරට

# නීච ළමයි!

ජාතික අධ්‍යාපන උසස් සහතිකය (එච්.එන්.සී.ඊ.) සඳහා දහවන ශ්‍රේණියේ ඉගෙනුම ලැබීමට මා ආනන්දයට යාමට පෙර ඉගෙන ගත්තේ ගලහිටියාව පරාක්‍රමබාහු මධ්‍ය මහා විද්‍යාලයේ හෙවත් කෙටියෙන් කියනවා නම්, ගලහිටියාව සෙන්ට්‍රල් එකේය. "සෙන්ට්‍රල්" යන ඉංගිරිසි වදන සඳහා "මධ්‍ය මහා" යන සිංහල යෙදුම අනුචිත බව කියවේ. නමුත් "වට රවුම", "ප්‍රසිද්ධ නොතාරිස්" යන වැරදි සහිත යෙදුම් සේම මෙයද භාවිතයෙන් ම ස්ථාපිත වී ඇත.

ගලහිටියාව මැදි විදුහලෙන් හෝ වෙනත් එවැනි පාසලක සිට ආනන්දයට යන කවර සිසුවෙකු වුවද මුලින් ම මුහුණ දෙන විපර්‍යාසයක් ඇත. එනම් පාසලේ, පන්ති කාමරයේ සංයුතියයි. ගලහිටියාව මැදි විදුහල මිශ්‍ර පාසලකි. කොල්ලෝත්, කෙල්ලෝත් එක්ව එහි උගත්හ. කොල්ලෝ එල්ලේ ගැසූහ. කෙල්ලෝ නෙට්බෝල් ගැසූහ. ආනන්දය පිරිමි පාසලකි. කොල්ලෝ පමණකි. කොල්ලෝ ක්‍රිකට් ගසති. බාස්කට් බෝල් ද ගසති. නෙට්බෝල් පිට්ටනියක් එහි නැත.

වඩාත් කැපී පෙනෙන වෙනස තිබෙන්නේ පන්ති කාමරයේය. ගලහිටියාව මැදි විදුහලේ දී, මා සිටි සෑම පන්තියකම පාහේ කොල්ලෝ ද කෙල්ලෝ ද සම සමව මෙන් සිටියහ. පන්ති කාමරයේ පුටු සහ මේස සකසා ඇත්තේ පැහැදිලි ලෙස ගොඩවල් දෙකකටය. මැදින් පටු කොරිඩෝවක් ඉතුරු කර, දෙපස එක් පේලියක පුටු මේස හතර බැගින් පේලි කිහිපයක් සකසා තිබුණි. එක් පසක කොල්ලෝය. අනෙත් පස කෙල්ලෝය. එක පිලක දසය දෙනෙකු පමණ සිටියහ. කෙල්ලෝ කොල්ලෝ අතර සැමවිටම යුධ මුක්ත කලාපයක් තිබුණි. මිශ්‍ර පාසලක් වුවද, මිශ්‍රව වාඩි වීමක් තිබුණේ ම නැත.

ආනන්දයේ මා මුලින්ම සිටි පන්ති කාමරයේ සැලසුම මීට හාත්පසින්ම වෙනස් විය. පන්තියේ සිටියේ කොල්ලෝ පමණක් නිසා, එය හරි මැදින් දෙකට බෙදීම අවශ්‍ය නොවීය. ඇත්තටම, පන්තිය තුනට බෙදා තිබුණු අතර, තුන් කොටසේම එක් පේලියක තිදෙනා බැගින් පේලි හතරක පමණ අපට ආසන සපයා තිබුණි. තුන් කොටසේම සිටියෝ කොල්ලෝ බව අමුතුවෙන් කිවයුතු නැත.

පන්ති කාමර වල සැලසුම කෙසේ වෙතත්, මිශ්‍ර පාසල් වල දී තරුණ කොල්ලන් කෙල්ලන් මිශ්‍රව ආශ්‍රය කරන නිසා, හුදු මිත්‍රත්වයෙන් ඔබ්බට ගිය "සුගත් දම්මි" ආකාරයේ ආදර සම්බන්ධකම් ඇතිවීම පුදුමයක් නොවේ. මා දන්නා හැටියට ජැක්සන් ඇන්තනි සහ කුමාරි මුණසිංහ සම්බන්ධය මෙලෙස ගලහිටියාව මැදි විදුහල පසුබිමේ ගොඩ නැගුණකි.

මා ගලහිටියාව මැදි විදුහලේ අටේ නමයේ පන්තිවල ඉගෙන ගනිද්දී, කුඩා කොල්ලන් වූ අප පරදවා, උසස් පෙල පන්තිවල සිටි ලොකු කොල්ලන්, අපේ පන්තියේ කෙල්ලන් ගේ සිත් දිනාගත් හැටි ද මට මතකය. අවාසනාවකට මෙන් මා ඉහල පන්තියකට යන වයස වෙනවිට මා සිටියේ තව දුරටත් කෙල්ලන් ද සිටින මිශ්‍ර පාසලක නොව කොල්ලන් ගෙන් පමණක් පිරි ආනන්දයේ ය. මේ ගැන සිතමින් මා දුක් වූ වාර ගණන නිමක් නොවේ.

පොදු වශයෙන් ගත් කල මිශ්‍ර පාසල් වල සිටින කොල්ලන් ට වඩා, පිරිමි පාසල් වල සිටින කොල්ලන් ට, කෙල්ලෙක් සමග කතා බහ කිරීමට අවශ්‍ය මානසික ශක්තිය හෙවත් සරල භාෂාවෙන් කියනවා නම් "ගට" අඩුවක් ඇත. මෙයට හේතුව ගට අඩු කොල්ලන්ව අල්ලා පිරිමි පාසල් වලට ඇතුළු කර තිබීමද, නැතිනම් පිරිමි පාසල් වල කොල්ලන්ට තම ගට වඩා ගැනීමේ අවස්ථාවන් මිශ්‍ර පාසල්වල කොල්ලන්ට තරම් සුලභව නොලැබීම ද යන්න තර්ක කල හැකි ප්‍රශ්ණයකි. මෙහි දෙවැනි හේතුව වඩාත් නිවරදිව සැබෑ තත්වය නිරූපනය කරන්නේ යැයි මම සිතමි.

අප වයස දසයට එළඹෙමින් සිටි ඒ අවදියේ දී කෙල්ලෙක් දෙස නොබලන, උනන්දු නොවෙන කොල්ලෙකු වූවානම් ඒ ඉතා කලාතුරකිනි. පාසල් යන එන දුම්රියේ දී ද, අතර මග පාගමනින් යද්දී ද මා වන් අනෙකුත් කොල්ලන් මෙන්ම මගේ ද විනෝදංශය වූයේ කෙල්ලන් දෙස බලා සතුටු වීමයි. සියයට පණහක් සාර්ථක වූ "වන්-වේ" ආකාරයේ ආදර සිතුවිලි ද විටින් විට පැන නොනැග්ගා නොවේ. ඒ උත්තේජනයෙන් කවි ද ලියවෙන්නට පටන්ගති. මා ලඟ දැන් ඇත්තේ, ඒ කවි ලියූ ඇක්සයිස් පොත් කිහිපය පමණක් බව ද මෙහිදී කිව යුතුය.

මා දහවන ශ්‍රේණියේ ඉගෙන ගන්නා කාලයේ පන්තියේ සිටි කර දඬු උස මහත් වූ කොල්ලෝ බහුතරයක්ම දිග කලිසම් ඇන්දහ. මා වැනි තවමත් කොට කලිසමෙන් ගැලවීමට වරම් නොලැබුණු අප අතර සිටියේ ටික දෙනෙකු පමණි. මොන කලිසම් ඇන්දත්, අප සියළු දෙනාගේම කමිස ඇඳීමේ අනිවාර්ය ක්‍රමය වූයේ ඇඟට කිටි කිටියේ හිරවෙන ලෙස මැසූ කමිසයේ කිසි දු වැඩිපුර කොටසක් කලිසමට උඩින් ඉතිරි නොවන සේ තිබෙන්නට ඇඳීමයි. අද මෙන් කමිසය කලිසමට යට කර ඇද, අඟල් කිහිපයක් බුරුලෙන් එල්ලෙන සේ තබා, බඩ වසා ගැනීමේ අවශ්‍යතාවයක් එකල අපට නොවුනා පමණක් නොව මෙලෙස කමිසය ඇඳීම සියළු ගැටවරයන් ගේ හෙවත් අද භාෂාවෙන් ටීනේජර්ලා ගේ "ඉස්ටයිල්" එක ද විය. නමුත් අත් උස්සන විට, අත් පද්දමින් ඇවිදින විට නැවතත් කමිසය කලිසමෙන් උඩට ක්‍රම ක්‍රමයෙන් පැමිණීම අනිවාර්යයෙන්ම සිදුවෙන නිසා නැවත නැවත කමිසය කලිසමෙන් ඇතුලට දැමිය යුතු විය.

එදා කොට කලිසම් ඇඳි මා වැනි සිසුන් ට නම් මෙලෙස කමිසය කලිසමේ ඇතුලට මනා ලෙස එබීම පහසුවෙන් කළ හැකි විය. අපට කිරීමට තිබුනේ කොට කලිසමේ පහලින් අත දමා, කමිසයේ කෙවලරින් අල්ලා තදින් පහලට ඇදීම පමණි.

දිග කලිසම් කාරයින්ට එය කල නොහැකි බව අමුතුවෙන් කිවයුතු නොවේ. ඔවුන්ට මේ සඳහා තිබූ එකම ක්‍රමය නම් කලිසම උඩින් මදක් ගලවා, කමිසය මනා පරිදි ඇතුලට රුවා හිරකර නැවත කලිසම ඇඳීමයි. මේ වන විට තවමත් කලිසම් සඳහා බොත්තම් පේලි යොදා තිබුනු අතර, ඒ බොත්තම් සහ බඳ පටි ගැලවීමටත්, ආපසු දැමීමටත් සහිතව මේ ක්‍රියාවලිය සඳහා දිග කලිසම් කාරයින්ට සෑහෙන වේලාවක් ගතවිය.

සවස එකහමාරට පාසල නිමවීමෙන් පසු වහා පිටවෙන දුම්රියෙන් යන එන අපි මරදාන දෙසට පයින් යන්නෙමු. පාසල් බස් රථ සාමාන්‍යයෙන් ආනන්දය ලඟින් පිටත්වෙන්නේ මද වේලාකට පසුව නිසා ඒ බස් වලින් යන සිසුන් ට අවශ්‍ය පණිදි ශරීර කෘත්‍යයන් යනාදිය සිදුකර, මුහුණ සෝද, හිස පීරා, කමිසය නිසි පරිදි කලිසමට හිර කර සකසා සැදී පැහැදී ගමන් ඇරඹීමට ඉඩ කඩ තිබේ. සමහර පාසල් බස් රථවල කෙල්ලන් ගමන් කිරීමද, ඒ නැතිවුනත් ගැහැණු පිරිමි සියළුම පාසල් නිමවන්නේ සාමාන්‍යයෙන් එකම වේලාවට නිසා පාරේ කෙල්ලන් සුලබ වීමද මෙලෙස මනා සේ සැදී පැහැදී පාසලෙන් පිටත් වීමට අනිවාර්ය හේතුව විය.

එක් දිනක් මෙසේ පාසල නිමවීමෙන් පසු පන්ති කාමරයේම මද වේලාවකට රැඳී නිවසට යෑමට පෙර කී පරිදි සැරසෙමින් සිටි අපේ පන්තියේ සිසුන් දෙදෙනෙකුට තවත් සිසුවෙකු පණිවිඩයක් රැගෙන පැමිණ ඇත. ඒ පණිවිඩය වූයේ, වහාම පහත මාලයේ අංශ ප්‍රධාන ගුරු මහතා හමුවන ලෙසයි. පාසල් බසයට තව ඇත්තේ කෙටි වේලාවක් වුවද මෙය මග හැරිය හැකි නියෝගයක් නොවේ. පොත් පත් ද රැගෙන, වහා තරප්පු පෙල බසිමින් කාර්යාලය දෙසට යද්දී, අපේ මිතුරන් දෙදෙනාගෙන් එක් අයෙකු පණිවිඩය ගෙනා සිසුවා ගෙන් මේ කුමක් සඳහා දැයි විමසීය. "අනේ මං නං දන්නේ නෑ. සර් කිව්වා අර උඩම තට්ටුවේ කෙලවරේ කාමයට ගිහින් එතන ඉන්න 'නීච ළමයි' දෙන්නට වහාම එන්න කියනවා" කියලා යැයි ඔහු පැවසීය.

මේ කැඳවීම කුමක් නිසා දැයි නොදැන තරමක බියෙන් අංශ ප්‍රධාන ගුරුවරයා හමුවීමට ගිය මිතුරන් දෙදෙනා එදා ඒ කාර්‍යාලයෙන් පිටතට පැමිණ ඇත්තේ ලැජ්ජාවෙන් රතු වෙමිනි. "නීච ළමයි" යනුවෙන් කීප වරක් ඔවුන්ට බැණ වැදී ඇති අංශ ප්‍රධාන ගුරුවරයා නැගූ ප්‍රශ්ණ වලින් සහ පැවසූ වදන් වලින් ඔවුන්ට වැටහී ඇත්තේ මෙයයි.

පාසැල නිමාවී මද වේලාවකට පසු අංශ ප්‍රධාන ගුරුවරයා පන්ති කාමර පිරික්සමින් ඉහල මාලයට පැමිණ ඇත. අපේ පන්ති කාමර අසලට ලඟාවෙනවාත් සමගම ඔහු දුටුවේ බඳ පටි සහ බොත්තම් ගැලවූ කලිසම් නැවත අඳිමින් සිටි සිසුන් දෙදෙනෙකි. මේ කර්තව්‍යයේ පසුබිම නොදැන වහා කාර්‍යාලයට ගිය ඔහු අප මිතුරන් දෙදෙනාට ඔහු හමුවෙන ලෙස දන්වා එවා ඇත්තේ ඔවුන් දෙදෙනා යම් කිසි සමලිංගික ක්‍රියාවක යෙදුනා යැයි සැක සිතා ඒ පිළිබඳ පරීක්‍ෂණයක් පැවැත්වීමටයි!

පාසැල් නිමවී ගෙදර යන කෙල්ලන් ඉදිරියේ කැපී පෙනීමට සැරසෙමින් සිටි ඔවුන්ට සිදු වූයේ එයට සහමුලින්ම ප්‍රතිවිරුද්ධ වූ ක්‍රියාවක් සඳහා සැකයට භාජනය වීමටයි. එතැන් පටන් "නීච ළමයි" යන්න අංශ ප්‍රධාන ගුරුවරයා හැඳින්වීමට අප යොදගත් සරදම් වදනක් විය.

කාලයෙන් කාලයට ඉස්මතු වන වෙනත් මෝස්තර සේම, ඇඟට හිරවෙන සේ කමිස මැහුම් ගසා කුඩා කර ඇඳීමද, කලිසමට හිරවෙන ලෙස කමිස යටට ඇද ඇඳීමද කාලයත් සමගම අභාවයට ගියේය.

ඉන් පසුව එළැඹියේ "බාච්චු" හෙවත් "බැගී" කමිස සහ කලිසම් සමයයි.

රසික සූරියආරච්චි

[rasika.suriyaarachchi@gmail.com]

## බ්ලොග් කතන්දර

### බන්ස් පාන්ස් සහ බෑග්ස්

මේක නං ඉතාමත් කෙටි කතන්දරයක්. කොච්චර ඇත්තක් ද කියල මං හරියට දන්නෙත් නෑ. හැබැයි මට අවුරුදු ගානකට ඉස්සෙල්ල මේ කතාව කියපු පොර නම් කිව්වෙ මේක සහතික ඇත්ත කියලයි.

මං ඒ ලෙවෙල් කරන කාලෙ අපි ගිය කෝච්චියෙම ගියා කෙල්ලෙක් සෙන්ට් පෝල්ස් එකට. මාර ලස්සනයි. හැබැයි ඒ අර ලංවෙන්න හිතෙන්නෙ නැති විදියේ ලස්සනක්.

ඒ කියන්නෙ කෙල්ලගෙ ලස්සනත් එක්කම හරිම සොෆිස්ටිකේටඩ් ගතියක් තිබුණා. දැක්කහම හිතෙන්නෙ නෑ ට්‍රයි එකක් දෙන්න. සිරා වැඩියි කියල හිතෙනව.

ඈත ඉඳන් බලා ඉන්න හොඳයි. ලඟට ගියොත් පිච්චෙයි කියල බයයි.

අපේ ස්ටේෂන් එක ල ග කඩ පේලියක් තියෙනවා. මේකෙ තියෙනව බේකරි කඩයක්. දවසක් මේ කතන්දරේ කියපු මගේ යාළුවා මෙතන ඉන්න කොට කඩේට ආවළු මේ කෙල්ල.

මෙන්න මට වාර්තා වුනු විදියට එතන මුදලාලි යි කෙල්ලයි අතර වුනු දෙබස.

කෙල්ලඃ මුදලාලි, බන්ස් තියෙනවද?
මුදලාලිඃ ඔව්‍

කෙල්ලඃ මුදලාලි, පාන්ස් තියෙනවද?
මුදලාලිඃ ඔව්‍

කෙල්ලඃ මුදලාලි, බෑග්ස් තියෙනවද?
මුදලාලිඃ ඔව්‍

කෙල්ලඃ මුදලාලි, බන්ස් දෙකකුයි, පාන්ස් එකකුයි, බෑග්ස් එකක දාල දෙනවද?

මේ කතාව මතක්වෙන මතක්වෙන වාරයක් පාසා අපිට හිනා ඒ දවස්වල. තාමත් එහෙමයි.

### බේසික් ෆෝට්‍රාන් ජාලිය

ඉස්කොලෙ යන කාලෙ විතරක් නෙමේ අදත් මට තියෙන ලොකුම ප්‍රශ්ණයක් තමා විෂයය කරුණක් ගැන අළුත් වචන දෙක තුනක් එකපාර ඔළුවට දා ගත්තම, ඒව එකිනෙකින් වෙන් කරල හඳුන ගන්න එක.

මේක අපි බොහෝ දෙනෙකුට තියෙන ප්‍රශ්ණයක්. උදාහරණ විදියට, 1/2, 3/2 වගේ භාග සංඛ්‍යාවක ඉරෙන් උඩ තියෙන්නේ ලවය ද හරය ද? හෘදය වස්තුවේ උඩ කුහර කර්ණිකා ද, කෝෂිකාද? කෝණයක සයින් අගය එන්නේ විරුද්ධ පාදය කර්ණයෙන් බෙදුවාම ද, බද්ධ පාදය කර්ණයෙන් බෙදුවාම ද, ඔන්න ඔය වගේ අති සරල, නමුත් ඉතා අසීරු ප්‍රශ්ණ.

අපි හුඟ දෙනෙක් දන්නව වගේ මේව මතක තියාගන්න පොඩි පොඩි උපක්‍රම තියෙනව.

ලවය හරය කියන උභතෝකෝටිකය විසඳන්නේ ලවයට ළමයාත්, හරයට හරකාත් ආදේශ කිරීමෙන්. හරකා ගෙ පිට උඩ ළමයා මිස ළමයා ගේ පිට උඩ හරකා වෙන්න බෑනෙ. ඉතිං ජීවිතේට ලවය හරය මාරුවෙන්නෙ නෑ.

මතකද, ආවර්තිතා වගුවෙ එක් එක් මූල ද්‍රව්‍ය තියෙන පිළිවෙල මතක තියාගන්න තිබුණ උපක්‍රම. බෝතලේ ඇලී, ගැලී ඉන්නා තැලියා. නිමල්ගෙයි පද්මිගෙයි ආස්සරේ ඇන්ටි බින්දා වගේ සරල ක්‍රම.

මේ කතන්දරයත් ඔන්න ඔය ලයින් එකේ එකක්.

ඔන්න එක පන්තියක දි පාඩම යන වෙලේ, එක කොල්ලෙක් නිදා ගෙන ඉන්නව වගේ දැක්ක ගුරුවරයා එක පාරටම උෟට දමල ගැහැව්ව ප්‍රශ්ණයකින්.

හා කියනව බලන්න, මොනවද තුන්වෙනි පරම්පරාවෙ පරිගණක භාෂා වලට උදාහරණ කිහිපයක්.

අපේ යාළුව අඩ නින්දෙන් ඇහැරුණා. පොරට යාන්තං මතකයි මේකට උත්තරේ. එකක් බේසික්, තව එකක් ෆෝට්‍රාන්. තුන් වෙනි එක මොකක්ද කියල එක පාරට කටට ආවෙ නෑ.

ඔන්න, ගඟෙන් එහා පැත්තෙ ඉස්කෝලෙ කොල්ලෙක් හිටිය උගෙ නම කීර්ති. කවුරුත් පොරට කීවෙ පැස්කුවල් කියලයි, ඒ කීර්ති පැස්කුවල් කියන ගායකයා හින්දයි. පැස්කුවල් එක්ක නිතරම ගැවසුන පැස්කුවල් ගෙ හොඳම යාළුවෙක් තමා ජාලිය.

ඔන්න සර් බලන් ඉන්නව අපේ පොර උත්තර දෙනකං. එක පාරටම උත්තරේ කටට ආව.

බේසික්, ෆෝට්‍රාන්, ජාලිය

මුළු පන්තියම හිනාවෙන කොටයි මෑන් ට තමන් ට වුනු වරද තේරුණේ.

ඉස්සර සයන්ටිෆික් වැඩ වලට පාවිච්චි කරපු කම්පියුටර් ලැන්ග්වේජ් එකක් තමයි පැස්කාල්. අපේ යාළුවා ලේසියට මේක මතක තියා ගෙන ඉඳල තියෙන්නෙ පැස්කුවෙල් කියලයි. පැස්කුවෙල් කියන්නෙ ගඟෙන් එගොඩ ඉස්කෝලෙ කොල්ලෙක් නේ. ඉතිං, නිදිමත පිටම එක පාටරම කටට ආවෙ පැස්කුවෙල් ගෙ නම නෙමේ පැස්කුවෙන්ගෙ හොඳම යාළුව ජාලිය ගෙ නම යි.

තව ටිකක් නිදිමත තිබුන නං කියයි ක්‍රිෂ්ණජිනා කියල

කතන්දර කාරයා
http://kathandara.blogspot.com/